Article 12(1).


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2016-06-04 |
|---|---|---|

පැමිණිලිකාර පාර්ශවය : එන්.එම්. හුසේන් මහතා,
අංක. 78/6 ඒ , රෝසවත්ත පාර,
මහනුවර.

වගඋත්තරකාර පාර්ශවය : විදුහල්පති,
මහ/ කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර

<u>පැමිණිලි අංකය : **HRC/K/667/16**</u>

**පැමිණිල්ලේ සැලකිරීම :-**

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, තමා අංක 78/6 ඒ, රෝසවත්ත පාර, මහනුවර ලිපිනයේ ස්ථිර පදිංචිකරුවකු වන බවත්, තම දරුවා වන එන්.එම්.එච්. අයියුබ් යන දරුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයට ඇතුලත් කිරීමට අදාළව අයදුම්පත් ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ පසු ලකුණු 82 ක් ලබා දුන් බවත්, තමා ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අංක 21891 දරණ ඔප්පුව හවුල් ඔප්පුවක් බැවින් ලකුණු ලබා නොදුන් බවත්, ඉන් පසු තමා අභියාචනා මණ්ඩලයටද අභියාචනා ඉදිරිපත් කිරීමෙන් පසු ස්ථාන පරීක්ෂණයට පැමිණ තමාට ලැබිය යුතු ලකුණු ප්‍රමාණය ලබා දෙන බවට එකී නිලධාරීන් පොරොන්දු වුවද මෙතෙක් කිසිදු ස්ථාන පරීක්ෂණයකට නොපැමිණි බවත්, තමාට ලැබිය යුතු අමතර ලකුණු 05 න් ලකුණු 03 ක්ද අඩු කර ලබා දී ඇති බවත්ය. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා තම දරුවා මහ/කිංස්වුඩ් විද්‍යාලයට ඇතුළත් කිරීමට අදාළව සාධාරණයක් ඉටු කර දෙන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 | ඊමේල් / மின்னஞ்சல் / E-mail | sechrc@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂනික / துரித அழைப்பு / Hotline | 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

වගඋත්තරකාර පාර්ශවීය සැලකිරීම :-

පැමිණිල්ලට අදාළ වගඋත්තරකාර පාර්ශවීය මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිෂන් සභාව වෙත කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු විසින් සිය දරුවා 2017 වර්ෂයේ පළමු වසරට ඇතුලත් කරගැනීමට අදාළව අයදුම්කර සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 82 ක් ලබා ගෙන ඇති බවත්, පැමිණිලිකරුගේ පදිංචිය සනාථ කිරීමට ඉදිරිපත් කර තිබූ ඉඩමේ ඔප්පුව පරීක්ෂා කිරීමේදී එය හවුල් ඔප්පුවක් බව තහවුරු වී ඇති බවත්, අධ්‍යාපන ලේකම්ගේ 17/2017 චක්‍රලේඛයේ 5.8 වගන්තියට අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුව අදාළ දරුවාගේ නම ලැයිස්තුවට ඇතුලත් නොකිරීමට තීරණය කරන ලද බවත් ය.

පැමිණිලිකරු අභියාචනා පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් වුවද එකී ලකුණුවල වෙනසක් නොවූ හෙයින් අවසන් ලැයිස්තුවට නම ඇතුළත් නොකළ බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතු වලදී අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලි පාර්ශවය සිය දරුවා 2017 වර්ෂයේ මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වන වසරට ඇතුළත් කර ගැනීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්කර සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 82 ක් ලබා ගෙන ඇති නමුත් දරුවා පාසලට ඇතුළත් කර නොගැනීම සම්බන්ධයෙන් උක්ත පැමිණිල්ල ඉදිරිපත් කර ඇත. වගඋත්තර පාර්ශවීය කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් පැමිණිල්ලට අදාළව කොමිසම වෙත ඉදිරිපත් කර ඇති වාර්තාවෙහි දක්වා ඇත්තේ පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඔප්පුව හවුල් ඔප්පුවක් බැවින්, හවුල් ඔප්පු සඳහා ලකුණු ප්‍රධානය කිරීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය කටයුතු නොකළ බවයි. හිමිකම තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඔප්පුව හවුල් ඔප්පුවක් වූ විට එහි නම සඳහන් සියළු අයවලුන්ට හවුල් ඔප්පුවෙහි හිමිකම පවතින බැවින් පැමිණිලිකරුටද එහි හිමිකම තහවුරු වන බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි.

17/2016 චක්‍රලේඛයට අනුව අයදුම්කරුගේ පදිංචිය තහවුරු නොවන්නේ නම් පමණක් තේරීම් ලේඛනයට නම ඇතුළත් නොකළ යුතු නමුත් හිමිකම තහවුරු නොවන්නේ නම් නම ඇතුළත් නොකළ යුතු බවට සඳහන් වී නොමැත. ඒ අනුව වගඋත්තර පාර්ශවීය කිංස්වුඩ් විද්‍යාලය අදාළ චක්‍රලේඛනය උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති අතර ඒ අනුව පැමිණිලි පාර්ශවයට අගතියක් සිදුවී ඇති බව පැහැදිලිව නිරීක්ෂණය වේ.

<u>ගයනි ගීතිකා එරෙහිව දිසානායක SC FR 35/2011</u> නඩු තීන්දුවෙහි, පදිංචිය සනාථ කිරීම අව්‍යාජව ගොඩනැගීම සඳහා සමුච්චිතීය ප්‍රතිඵලයක් ලබාගැනීමට පළමු ශ්‍රේණිය සඳහා වූ අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර ඇති ලේඛන සියල්ල සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කළ යුතු බවට දක්වා ඇත.

මේ අනුව පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණයේ ලකුණු 82 ක් ලබා ගෙන ඇති අතර, පදිංචිය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඔප්පුව හවුල් ඔප්පුවක් වුවද අදාළ ඔප්පුව සඳහා පාර්ශවයක් ලෙස හිමිකම් කියන බැවින්

අදාළ ඔප්පුව සඳහා ලකුණු 10 ක් හිමිවිය යුතු බව නිරීක්ෂණය වේ. ඒ අනුව අදාළ පාසලේ 1 වන වසරට ළමුන් ඇතුළත් කර ගන්නා අවම ලකුණු සීමාව ලකුණු 88 ඉක්මවා ලකුණු ලබා ගැනීමේ හැකියාව ඇති බැවින් පැමිණිලිකරුගේ දරුවාට අදාල විද්‍යාලයට ඇතුළත් වීමට නිත්‍යානුකූල හිමිකම පවතින බව තහවුරු වේ.

**නිගමනය :-**

මෙකී කරුණු අනුව, වගඋත්තර පාර්ශවීය කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වන වසරට දරුවන් ඇතුළත් කර ගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා මණ්ඩලය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කර දී ඇති සර්ව සාධාරණයේ මූලික අයිතිය පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පැමිණිලිකරුගේ දරුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

2019. 07.08 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

01. අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මයා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය බත්තරමුල්ල.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/